## HSBC ශ්‍රී ලංකා- සමාජ මාධ්‍ය නීතිරීති හා කොන්දේසි

ශ්‍රී ලංකාවේ ද හොංකොං ඇන්ඩ් ෂැංහායි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් ('HSBC') විසින් ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමට, සම්බන්ධ වීමට හා සහාය වීම සඳහා සමහර සමාජ මාධ්‍ය වෙබ්අඩවි වල නාලිකා, පිටු සහ ගිණුම් ක්‍රියාත්මක කරයි. වෙනත් ආකාරයකින් ප්‍රකාශ කර නොමැති නම්, මේවා ශ්‍රී ලංකාවේ ගනුදෙනුකරුවන් වෙනුවෙන් පවතින අතර, ශ්‍රී ලංකාවේ භාවිතය සඳහා නිර්මාණය කර තිබේ. අපගේ සේවාවන් වැඩිදියුණු කිරීමට හැකි වන පරිදි HSBC පිළිබඳව මෙම නාලිකාවල දක්වන ලද අදහස් සහ පළ කිරීම් අපි විසින් නිරීක්ෂණය කර වාර්තාගත කරන්නෙමු.

HSBC විසින් පළ කර ඇති තොරතුරු හැර එම වෙබ්අඩවි වල පළ කරන ලද කිසිදු තොරතුරක් සඳහා අප කිසිදු වගකීමක් නොදරයි. සමාජ මාධ්‍ය අඩවි, ඔවුන්ගේ සැලසුම් හෝ සේවාවන් හෝ තෙවන පාර්ශ්වයන් හෝ වෙනත් පරිශීලකයින් විසින් ඒ සම්බන්ධයෙන් පළ කරන ලද කිසිදු තොරතුරක් අපි අනුමත නොකරමු. HSBC විසින් භාවිත කරන සමාජ මාධ්‍ය අඩවි වල භාවිත නියමයන් සහ ප්‍රතිපත්ති (උදා: Twitter සහ Facebook) HSBC හි නාලිකා සහ පිටු ඔබේ භාවිතයට ද අදාළ වන අතර, ඔබ මෙම භාවිත නියමයන් සහ ප්‍රතිපත්ති මෙන්ම HSBC හි නියමයන් සහ ප්‍රතිපත්ති ද අනුගමනය කරන බවට සහතික විය යුතුය. අදාළ නීති, රෙගුලාසිවලට හෝ ඔබ HSBC සමග ඇතිකරගෙන ඇති ගිවිසුම්වල නියමයන්ට පටහැනි ලෙස මෙම වෙබ්අඩවියට අදාළව කිසිදු ක්‍රියාකාරකමක නිරත නොවන බවට ඔබ එකඟ වේ.

මෙම වෙබ්අඩවියේ අන්තර්ගතය සහ තොරතුරු දැක්වෙන්නේ, තොරතුරු දැනගැනීමේ අරමුණු සඳහා පමණක් වන අතර, HSBC කොටස්, සුරැකුම්පත් හෝ කිසියම් මූල්‍ය උපකරණයක්, සැලසුමක් හෝ සේවාවක් මිලදී ගැනීම සඳහා අර්පණයක් හෝ ඉල්ලීමක් ලෙස අදහස් නොකෙරේ. HSBC සමාජ මාධ්‍ය වෙබ්අඩවි හරහා ආයෝජන, බදු හෝ වෙනත් වෘත්තීය උපදෙස් ලබා නොදෙයි. ගනුදෙනුකරුවෙකු ලෙස ඔබ සමග විය හැකි අපගේ ගිවිසුම් කිසිවක් විතැන් කිරීමක්, වෙනස් කිරීමක් හෝ අභිබවා යාමක් හෝ මෙම වෙබ්අඩවියේ ඔබ සහ HSBC අතර ඇති කිසිදු සන්නිවේදනයක් මගින් සිදු නොවේ.

ඔබ සමාජ මාධ්‍ය හරහා HSBC සමග සම්බන්ධ වනවිට, ඔබේ පුද්ගලික දත්ත HSBC පාලනයෙන් බැහැර අදාළ සමාජ මාධ්‍ය වෙබ්අඩවියේ සර්වරයේ ගබඩා විය හැක. අපි ඔබේ පුද්ගලික දත්ත භාවිත කරන ආකාරය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා, කරුණාකර අපගේ රහස්‍යතා ප්‍රතිපත්තිය බලන්න. එවැනි වෙබ්අඩවි වල පළ කරන ඕනෑම තොරතුරක් සාමාන්‍ය ජනතාවට ප්‍රවේශ වී කියැවීමට හැකිය. එය, පුද්ගලික ගිණුම් තොරතුරු හෝ මූල්‍ය විධිවිධාන හෝ සාකච්ඡා කිරීමට සුදුසු ස්ථානයක් නොවේ. සමාජ මාධ්‍ය වෙබ්අඩවි හරහා පුද්ගලික, ගිණුම් හෝ ආරක්ෂණ තොරතුරු බෙදා ගැනීමට HSBC විසින් ඔබෙන් ඉල්ලා නොසිටින අතර, එම නාලිකාවල එවැනි තොරතුරු පළ නොකළ යුතුය. අප

විසින් අපගේ සමාජ මාධ්‍ය වෙබ්අඩවි වල පළ කරන අන්තර්ගතයන් ඔබ විසින් වෙනස් නොකළහොත් සහ එම අන්තර්ගතයේ මූලාශ්‍රය ලෙස ඔබ විසින් අපව උපුටා දක්වන්නේ නම් හෝ ඒවා බෙදා ගැනීමට සහ අදහස් දැක්වීමට ඔබට අවසර ඇත. අපගේ සමාජ මාධ්‍ය වෙබ්අඩවි වල අප පළ කරන සියලුම මුල් අන්තර්ගතයන් වලට ප්‍රකාශන හිමිකම HSBC සතු වන අතර, HSBC වෙළඳ ලකුණු, ලාංඡන හෝ මෝස්තර HSBC හි බුද්ධිමය දේපල වේ.

HSBC හෝ මෙම වෙබ්අඩවියේ තොරතුරු නිර්මාණය කිරීම, නිෂ්පාදනය කිරීම හෝ බෙදා හැරීමට සම්බන්ධ වෙනත් පාර්ශ්වයන් හෝ නිලධාරීන්, අධ්‍යක්ෂවරුන්, සේවකයින් හෝ ඉහත සඳහන් කළ කිසිවකුගේ නියෝජිතයන්, මෙම වෙබ්අඩවිය හෝ මෙම වෙබ්අඩවිය හා සම්බන්ධිත වෙබ්අඩවියක් භාවිත කිරීම හෝ මෙම වෙබ්අඩවිය භාවිත කිරීමට ප්‍රමාද වීම හෝ නොහැකියාව සමග හෝ සම්බන්ධිත වෙබ්අඩවිය, එවැනි හානි සිදුවීමේ හැකියාව පිළිබඳව HSBC දැනුවත් කර ඇතත්, නැතත්, කිසියම් වක්‍ර, විශේෂ, දණ්ඩනීය, ප්‍රතිවිපාක හෝ වක්‍ර හානි (සීමාවකින් තොරව අහිමි වූ ලාභ, ආදේශක සේවාව ලබා ගැනීමේ පිරිවැය හෝ අහිමි වූ අවස්ථාවන් ඇතුළත්ව) සඳහා කිසිදු ආකාරයකින් වගකිව යුතු නොවේ. මෙම සීමාකිරීමට පරිශීලකයෙකුගේ උපකරණයට බලපෑ හැකි ඕනෑම වෛරස, දත්ත හෝ හානිකර කේතයක් සම්ප්‍රේෂණය කිරීම, මෙම වෙබ්අඩවියේ ගොනු සහ පරිශීලකයාගේ බ්‍රවුසරය හෝ වෙනත් වෙබ්අඩවි ප්‍රවේශ වැඩසටහනක් අතර කිසියම් නොගැලපීමක්, හෝ කිසියම් ඉලෙක්ට්‍රොනික හෝ කිසියම් අසාර්ථකත්වයක් ද දුරකථන උපකරණ, සන්නිවේදන හෝ සම්බන්ධතා මාර්ග, අනවසර ප්‍රවේශය, සොරකම්, ක්‍රියාකරු දෝෂ හෝ පාලනයෙන් බැහැර ඕනෑම සිදුවීමක් ද ඇතුළත් වන නමුත් ඊට සීමා නොවේ. HSBC විසින් මෙම වෙබ්අඩවියට හෝ සම්බන්ධිත අඩවියකට අඛණ්ඩ, බාධාවකින් තොරව හෝ ආරක්ෂිත ප්‍රවේශයක් සහතික නොකරයි. සම්බන්ධිත අඩවි මගින් සපයනු ලබන අන්තර්ගතය, නිරවද්‍යතාව, අදහස් ප්‍රකාශ කිරීම සහ අනෙකුත් සබැඳි HSBC විසින් විමර්ශනය කිරීම, සත්‍යාපනය කිරීම, අධීක්ෂණය කිරීම හෝ අනුමත කිරීම අවශ්‍ය නොවේ. වෙබ්අඩවියේ හෝ සම්බන්ධිත වෙබ්අඩවියක ප්‍රකාශයට පත් කරන ලද තොරතුරු, මෘදුකාංග, සැලසුම් සහ සේවා පිළිබඳ විස්තරයේ සාවද්‍ය හෝ මුද්‍රණ දෝෂ ඇතුළත් විය හැකි අතර, HSBC සහ/හෝ HSBC සාමාජිකයින් එවැනි සාවද්‍ය හෝ දෝෂ සඳහා වගකීම ප්‍රකාශිතවම ප්‍රතික්ෂේප කරයි. වෙබ්අඩවියේ සහ සම්බන්ධිත අඩවි වල තොරතුරු සඳහා වරින් වර වෙනස්කම් සිදු කරනු ලැබේ. HSBC විසින් වෙබ්අඩවියට ඕනෑම වේලාවක වැඩිදියුණු කිරීම් හෝ වෙනස්කම් සිදු කළ හැක.

පුද්ගලික තුවාල, මරණය, හානි හෝ අලාභය සඳහා වගකීම ඇතුළුව, වෙබ්අඩවියේ කිසියම් අත්හිටුවීමක්, වෙනස් කිරීමක් හෝ අවලංගු කිරීමක්, තාක්ෂණික ගැටලු, ලැබුණු හෝ පළ කරන ලද ඉදිරිපත් කිරීම් ඇතුළුව, නමුත් ඒවාට සීමා නොවී ඕනෑම ආකාරයකින් පැන නගින ඕනෑම වගකීමකින් ඔබ HSBC, සහ එහි මව් සමාගම්, සම්බන්ධිත, අනුබද්ධිත ආයතන, නිලධාරීන්, අධ්‍යක්ෂවරුන්, නියෝජිතයින්, සේවකයින්, සේවා සපයන්නන්, සහ වෙබ්අඩවියේ සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම

හා සම්බන්ධ අනෙකුත් සියලුම තැනැත්තන් නිදහස් කරයි. තවද, මෙම වෙබ්අඩවියට ඇතුළු වීමෙන්, එය නැරඹීමෙන්, ඊට ප්‍රවේශ වීමෙන්, ඉන් බාගත කිරීමෙන්, එය බ්‍රවුස් කිරීමෙන් හෝ වෙනත් ආකාරයකින් භාවිත කිරීමෙන් HSBC, එහි නියෝජිතයින්, සේවා සපයන්නන් සහ ඔවුන්ගේ මව් සමාගම් සහ සහ ඔවුන්ගේ අනුබද්ධිත ආයතන, අනුබද්ධිත, අනුප්‍රාප්තිකයින්, බලපත්‍රලාභීන් සහ ලැබුම්කරුවන්ට සහ ඔවුන්ගේ එක් එක් අධ්‍යක්ෂවරුන්, නිලධාරීන්, නියෝජිතයින්, කොටස් හිමියන් සහ සේවකයින්, මෙම නියමයන් සහ කොන්දේසි හෝ ඔබගේ ඉදිරිපත් කිරීම් උල්ලංඝනය කිරීමකින් පැනනගින ඕනෑම සහ සියලුම අයැදීම්, පාඩු, වියදම්, හානි, වගකීම් සහ පිරිවැය සහ වියදම් (සාධාරණ නීතිඥ ගාස්තු සහ වියදම් ඇතුළුව) සඳහා හානිපූරණය කිරීමට, ආරක්ෂා කිරීමට සහ රඳවා ගැනීමට ඔබ එකඟ වේ.

අලෙවි සන්නිවේදන ලැබීමේ විකල්පය අතහැරීම

ඕනෑම වේලාවක අප විසින් ඔබ වෙත සෘජු තැපැල් යැවීම සහ සමාජ මාධ්‍ය ඔස්සේ ඔබ වෙත ප්‍රචාරණය සිදු කිරීම නතර කිරීමට ඔබ අදහස් කරන්නේ නම්, කරුණාකර 2 511 611 ඇමතීමෙන් අපගේ ඇමතුම් මධ්‍යස්ථානයේ සිටින අපගේ නියෝජිතයින් අමතන්න. එවිට ඔබට කිසිදු වියදමක් නොමැතිව, ඔබගේ ඉල්ලීමට අනුව අප ක්‍රියා කරනු ඇති අතර, දින 30ක් ඇතුළත සහ සෘජු තැපැල් මගින් සහ සමාජ මාධ්‍ය ප්‍රචාරණ ව්‍යාපාර හරහා අනාගත සෘජු අලෙවිකරණ ප්‍රවර්ධන සඳහා ඔබව ඇතුළත් කර නොගන්නා බවට සහතික වෙමු.

HSBC විසින් වෙනත් ඕනෑම Twitter හෝ Facebook පරිශීලකයෙකු පිටු හෝ පැතිකඩ අනුගමනය කිරීම, හෝ නැවත ට්වීට් කිරීම හෝ ඕනෑම තෙවන පාර්ශ්වීය අන්තර්ගතයක් බෙදා ගැනීම මගින් ඒවා අනුමත කිරීමක් සිදු නොකරයි.

HSBC විසින් දැනට ශ්‍රී ලංකාවේ පහත දැක්වෙන නිල සමාජ මාධ්‍ය නාලිකා ක්‍රියාත්මක කරයි: HSBC Sri Lanka Facebook පිටුව.

වැඩිදුර මගපෙන්වීම් සඳහා පිවිසෙන්න.

http://www.hsbc.com/terms-and-conditions?WT.mc_id=HGHQ_twitter_tnc#socialmedia